දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපන කිරීමේ භාර අරමුදල.

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෘශ්‍යාබාධිත කාන්තා සුභසාධන මධ්‍යස්ථානයේ 2012 දෙසැම්බර් 31 දිනට රු.104,485 ක් වූ නිමි භාණ්ඩ තොගය විකුණුම් මිල මත අගය කර තිබුණි.

(ආ) 2012 වර්ෂයට අදාලව රු.1,383,233 ක් අගයකින් යුත් ජ'නල් සටහන් 05 ක් මඟින් ගිණුම්වලට ඇතුළත් කර තිබුණත් ජ'නල් සටහන් වගකිව යුතු නිලධාරියකු විසින් අත්සන් කර නොතිබුණ අතර ඒ සඳහා ජ'නල් වවුචර් ද පිළියෙල කර නොතිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් 31 දින වන විට රු.392,854 ක බැරකම් ගිණුම්ගත නොකිරීමෙන් වර්ෂයේ වියදම අඩුවී තිබුණි. ඒ අනුව වර්ෂයේ අතිරික්තය රු.392,854 කින් වැඩිවී තිබුණු අතර 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ ජංගම බැරකම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ගෙවිය යුතු විගණන ගාස්තු ලෙස 2011 වර්ෂය සඳහා රු.22,176 ක්ද 2012 වර්ෂය සඳහා රු.23,000 ක්ද ලෙස එකතුව රු.45,176 ක මුදලක් ශේෂ පත්‍රයේ ජංගම බැරකම් ලෙස දැක්විය යුතු වුවද, රු.56,889 ක් ලෙස දැක්වීම හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට

ජංගම බැරකම් රු.11,713 කින් වැඩිපුර දක්වා තිබුණ අතරම අතිරික්තය ද එම ප්‍රමාණයෙන් අඩු වෙන් දක්වා තිබුණි.

**1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීය.

| විස්තරය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) ණයහිමියන් | 854,344 | ණයහිමි ලේඛනය |
| (ආ) ගෙවිය යුතු වියදම් | 776,301 | විස්තරාත්මක උපලේඛන |
| (ඇ) කාලය සඟරාව මුද්‍රණය | 108,000 | ඇස්තමේන්තු හා බිල්පත් |
| (ඈ) අක්ෂි කාච සඳහා ලැබෙන අයදුම්පත් | - | අදාළ ලේඛනය |
| (ඉ) කොහු ඉදල් ව්‍යාපෘතිය | 60,000 | තෝරාගත් පුහුණුලාභීන්ගේ නාමලේඛනය |
| (ඊ) ලියන රාමු | 32,000 | බිල්පත් |
| (උ) කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා ලබාගත් අත්තිකාරම් | 63,000 | ඇස්තමේන්තු |
| (ඌ) විශ්වවිද්‍යාල ශිෂ්‍යාධාර ගෙවීම් | - | අදාළ ලේඛනය |
| (එ) දෘශ්‍යාබාධිත විශ්ව විද්‍යාල ශිෂ්‍යාධාර | 129,000 | අත්සන් ලේඛනය |
| (ඒ) ශ්‍රී ලංකා අන්ධ ජන සේවා මණ්ඩලය පවත්වා ගෙන යනු ලබන පුනරුත්ථාපන ව්‍යාපෘතියේ පුහුණු වැඩසටහන් සඳහා දීමනා | | |
| (i) උපදේශන දීමනා | 161,000 | පැමිණීමේ ලේඛන සමාජ සේවා නිලධාරියෙකු හෝ වගකිව යුතු නිලධාරියෙකු අධීක්ෂණය කළ බවට තහවුරුවක් |
| (ii) ශිෂ්‍ය දීමනා | 45,625 | |

**1.2.3 නීතී,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත සඳහන් නීති,රිතී,රෙගුලාසි ආදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ).රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | දෘශ්‍යාබාධිත කාන්තා සුහසාධන මධ්‍යස්ථානයේ අමු නූල් මිලදී ගැනීම සඳහා පුද්ගලික ආයතනයට රු.180,000 ක් ගෙවා තිබුණද, ඒ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ).මු.රෙ 369 (ඩී) | නිකුත් කර මාස 06 ක් ඉකුත්වී ඇති රු.18,300 ක් වටිනා චෙක්පත් 10 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.606,747 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.1,862,057 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,468,804 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

2012 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම සහ 2012 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාවට අනුව ප්‍රගතිය පහත දැක්වේ.

| විස්තරය | භෞතික | | මූල්‍ය | | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| | **ක්‍රියාකාරි සැලැස්ම අනුව** | **සත්‍ය** | **ක්‍රියාකාරි සැලැස්ම අනුව** | **සත්‍ය** | **භෞතික** | **මූල්‍ය** |
| | | | | | % | % |
| ක්‍රීඩා ආධාර පුද්ගලයින් | 15 | 01 (දෘශ්‍යාබාධිත ක්‍රිකට් සංගමයට) | 50,000 | 50,000 | 7 | 100 |
| වෘත්තිය පුහුණු (උපදේශකවරු දීමනා) | 04 | 03 | 230,000 | 149,000 | 75 | 65 |
| අධ්‍යාපන හා සංස්කෘතික ආධාර | 250 | 177 | 1,700,000 | 916,000 | 71 | 54 |
| පුනරුත්ථාපන ආධාර | අන්ධ ජන සේවා මණ්ඩලය<br>චලතාවය හා දිසානතිය උපදේශක දීමනා<br>දෘශ්‍යාබාධිත ජනතා සම්මේලනය | අන්ධ ජන සේවා මණ්ඩලය<br>චලතාවය හා දිසානතිය උපදේශක දීමනා<br>දෘශ්‍යාබාධිත ජනතා සම්මේලනය | 900,000 | 942,434 | - | 105 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| අක්ෂි කාච හා අක්ෂි ප්‍රතිකාර | 100 | 78 | 850,000 | 705,859 | 78 | 83 |
| දෘශ්‍යාබාධිත කාන්තා සුභසාධන මධ්‍යස්ථානය | 08 | 04 | 400,000 | 444,988 | 50 | 111 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෘශ්‍යාබාධිතයින් 15 දෙනෙකු සඳහා 2012 වර්ෂයේ ක්‍රීඩා ආධාර ලබාදීමට රු.50,000 ක ප්‍රතිපාදන සලසා තිබුණත් දෘශ්‍යාබාධිතයින්ගේ ක්‍රිකට් සංගමය වෙත එම රු.50,000 ගෙවා තිබුණි.

(ආ) 2012 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව සිසුන් 250 ක් සඳහා රු.1,700,000 ක් අධ්‍යාපන ආධාර වශයෙන් ප්‍රතිපාදනය කර තිබුණත් සිසුන් 179 ක් සඳහා රු.916,000 ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව එහි මුල්‍ය කාර්ය සාධනය සියයට 71.6 ක් වූ අතර භෞතික කාර්ය සාධනය සියයට 53.9 ක් වී තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් වෙත 2012 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා රු.485,000 ක ශිෂ්‍යාධාර ගෙවීම් ප්‍රමාද කර තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත ජනතා සම්මේලනය විසින් පවත්වාගෙන යනු ලබන අනුරාධපුර මහමීගස්සෑගම දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ 2012 වර්ෂයේ වියදම් වෙනුවෙන් රු.490,948 ක් ගෙවා තිබුණි. මෙම ගෙවීම් කිරීමේදී ග්‍රාම නිලධාරී, සමාජ සේවා නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් එහි සිටි නේවාසික පුද්ගලයින් සංඛ්‍යාව පිළිබඳ තහවුරු කර තිබුණු අතර පහත සඳහන් කාර්යභාරයන් ඔවුන් විසින් ඉටු කර නොතිබුණි.

i. පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ ඒවායේ කාර්ය සාධනය පිළිබඳ විස්තර අරමුදල ලබාදී නොතිබුණි.

ii. දෘශ්‍යාබාධිත ජනතා සම්මේලන අධීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි.

iii. ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පසුවිපරම් සිදු කර නොතිබුණි.

(ඉ) 2012 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව පුද්ගලයින් 08 දෙනෙකු පුහුණු කිරීමට අපේක්ෂා කර තිබුණත් 04 දෙනෙකු පමණක් පුහුණු කර තිබුණි. ඒ අනුව එහි භෞතික ප්‍රගතිය සියයට 50ක ප්‍රතිශතයක් වී තිබුණි.

## 3.2 කාර්ය මණ්ඩල

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලේකම් තනතුරෙහි කටයුතු කරන නිලධාරියාගේ විධිමත් පත්වීම් ලිපිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) භාර අරමුදල සඳහා 2005 ඔක්තෝබර් 24 දිනැති අංක ඩීඑම්එස්/ඩබ්ඊ සහ එස්ඩබ්/16 දරණ ලිපිය මඟින් ලිපිකරු තනතුරක් අනුමත කර තිබුණත්, ලේකම් තනතුර සඳහා අනුමැතියක් ලබාදී නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

අයවැය ලේඛනයේ සඳහන් ඇස්තමේන්තු ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 10 සිට සියයට 100 ක පරාසයක් තුල විචලනයන් නිරීක්ෂණය වු බැවින් සඵල කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස අයවැය ලේඛනය යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන්හි අඩුපාඩු වරින් වර අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි.

(අ) ශිෂ්‍යාධාර ගෙවීම.

(ආ) උපදේශන දීමනා.

(ඇ) දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපන ව්‍යාපෘති.

(ඈ) දෘශ්‍යාබාධිත කාන්තා සුභසාධන මධ්‍යස්ථානය.